සැ. යු.- 2010.09.09 දින පළවූ අංක 1,671 දරන ගැසට් පත්‍රයේ I-II (අ) සහ IV (අ) කොටස් පළ නොවිය.
මෙම ගැසට් පත්‍රයේ දෙමළ අනුවාදය වෙනම මුද්‍රණය කෙරේ.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 1,672 - 2010 සැප්තැම්බර් මස 17 වැනි සිකුරාදා - 2010.09.17**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# IV (අ) වැනි කොටස - පළාත් සභා

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)


| | පිටුව |
|---|---|
| ආණ්ඩුකාරවරුන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය ... ... | — |
| ආණ්ඩුකාරවරුන් විසින් කරන ලද පත්කිරීම් ආදිය ... ... | — |
| වෙනත් පත්කිරීම් ... ... ... ... | — |
| පළාත් සභා නිවේදන ... ... ... ... | 1538 |
| පළාත් සභා විවිධ දැන්වීම් ... ... ... ... | — |
| තනතුරු ඇබෑර්තු ... ... ... ... | — |
| විභාග විභාග ප්‍රතිඵල ආදිය ... ... ... ... | — |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

## වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලුම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතුය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2010 සැප්තැම්බර් මස 24 වැනි දින පළ කරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2010 සැප්තැම්බර් මස 09 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතුය.

**ලක්ෂමන් ගුණවර්ධන,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2010 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

1537- B 080154— 7,100 (2010/09)
F1-(S/E)

# පළාත් සභා නිවේදන

## රජයේ ඉඩම් ආඥාපනත යටතේ අන්සතු කිරීමට ඇති ඉඩම් සඳහා අවසර පත්‍ර ලැබීමට ගොවිජන පංතියට අයත් තැනැත්තන් නොවන තැනැත්තන් තෝරා ගැනීම සඳහා වූ ඉඩම් කච්චේරි පිළිබඳ නිවේදනය

පහත විස්තර කර ඇති ඉඩම් සඳහා ඉල්ලුම්පත්‍ර සලකා බැලීමට සහ ඒවායේ ඉඩම් කොටස් සඳහා අවසර පත්‍ර ලැබීමට සුදුසු තැනැත්තන් තෝරා ගැනීමට නිකවැරටිය ප්‍රාදේශීය ලේකම්වරයා විසින් 2010 ඔක්තෝබර් මස 28 වැනි දින පෙ. ව. 10.00ට නිකවැරටිය ප්‍රදේශීය ලේකම් කාර්යාලයේ දී රජයේ ඉඩම් ආඥාපනත යටතේ ඉඩම් කච්චේරියක් පත්වනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

(අ) ඉඩමේ විස්තරය : අ. ග. පි. 1991 නිකවැරටිය, අ. ග. පි. 1995 මාගල්ලේගම, අ. ග. පි. 3046 හැවැන්පැලැස්ස, අ. ග. පි. 3045 ගලපිටියාගම, අ. ග. පි. 1994 හාතිගම්මන, අ. ග. පි. 1992 බුදුමුත්තාව, අ. ග. පි. 1990 දනිකිතව

(ආ) ඉඩමේ මැනුම් විස්තරය : ඉහත පිඹුරුවලට අයත් කොටස්

(ඇ) ඉඩම පිහිටි ගම : නික/දකුණ, නික/උතුර, මාගල්ලේගම, මිල්ලගොඩ, හැවැන්පැලැස්ස, ගලපිටියාගම, හාතිගම්මන, බුදුමුත්තාව, කරකොලේ යන ගම්වල පිහිටි නිකවැරටිය නගර සීමාවට අයත් බිම් කොටස්

(ඈ) ග්‍රාම නිලධාරී කොට්ඨාසය හෝ කොට්ඨාස : 293 නික/උතුර, 294 නික/දකුණ, 296 මාගල්ලේගම, 297 මිල්ලගොඩ, 299 හැවැන්පැලැස්ස, 304 ගලපිටියාගම, 305 හාතිගම්මන, 306 බුදුමුත්තාව, 313 කරකොලේ.

(ඉ) උප දිසාපති හෝ ප්‍රාදේශීය ආදායම් නිලධාරී කොට්ඨාසය : නිකවැරටිය

(ඊ) දිස්ත්‍රික්කය : කුරුණෑගල

(උ) අන්සතු කිරීමට ඇති ඉඩමේ ස්වභාවය (වාරි මාර්ග පහසුකම් සලසන ලද හා/හෝ වාරිමාර්ග පහසුකම් සලසා නොමැති) : වාරිමාර්ග පහසුකම් සලසා නොමැති ගොඩ ඉඩම

(ඌ) අන්සතු කරනු ලබන ඒකකය :
1. වාරිමාර්ග පහසුකම් සලසන ලද ඉඩම : අදාළ නොවේ
2. ගොඩ ඉඩම : නේවාසික කටයුතු සඳහා පර්. 15-20 දක්වා/ව්‍යාපාරික කටයුතු සඳහා පර්. 2 1/2 සිට 15 දක්වා

2. පහත දැක්වෙන පංතියට හෝ පංතිවලට අයත් නිකවැරටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ ස්ථිර පදිංචි පුද්ගලයන්ගෙන් ලැබෙන ඉල්ලුම්පත්‍ර සලකා බලනු ලැබේ.

1. අඩු ආදායම් ලාභීන් ;
2. වැඩි ආදායම් ලාභීන්.

ඉහත සඳහන් පංතියට හෝ පංතිවලට තමන් අයත් වන බව සනාථ කිරීම සඳහා ප්‍රාදේශීය ලේකම්වරයා විසින් නියම කරනු ලැබිය හැකි සාධක ඉල්ලුම්කරුවන් විසින් ඉදිරිපත් කල යුතු ය.

3. සියලුම ඉල්ලුම්පත්‍ර 2010.10.20 වැනි දින හෝ ඊට පෙර ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, නිකවැරටිය වෙත ලැබිය යුතු ය. සියලුම ඉල්ලුම්පත්‍ර නියමිත ආකෘතියේ විය යුතු ය.

4. ඉල්ලුම්කරු ඉඩම් ලැබීම සඳහා සලකා බලනු ලැබීමට සුදුසු වන්නේ නම් 2010 ඔක්තෝබර් මස 28 යන දින පෙ. ව. 10.00ට නිකවැරටිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී පැවැත්වෙන ඉඩම් කච්චේරියට පැමිණෙන ලෙස ප්‍රාදේශීය ලේකම්වරයා ඔහුට නියම කරනු ලැබේ. ඉඩම් ලැබීම සඳහා සලකා බලනු ලැබීමට කැමති සෑම තැනැත්තෙක්ම පෞද්ගලිකව පැමිණිය යුතු ය. එසේ නැතහොත් තමන් නියෝජනය කිරීම සඳහා වෙනත් අයෙකු ලියවිල්ලක් මගින් ඉදිරිපත් කළ යුතු ය.

5. ඉල්ලුම්කරු හෝ ඔහු නියෝජනය කරනු තැනැත්තා හෝ විසින් ඉල්ලුම්පත්‍රයේ සඳහන් කර ඇති තොරතුරු සනාථ කෙරෙන සියලුම සාධක හෝ ප්‍රාදේශීය ලේකම්වරයා විසින් නියම කරනු ලබන වෙනත් අදාළ තොරතුරු ඉඩම් කච්චේරියේදී ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

6. තෝරාගනු ලබන සෑම ඉල්ලුම්කරුවෙකුටම මුල් අවස්ථාවේදී අවසර පත්‍රයක් ලැබෙන අතර, එය එහි සඳහන් කොන්දේසිවලට යටත් වනු ඇත.

7. අවසර පත්‍රයක් ලැබීමට තෝරාගනු ලබන සෑම තැනැත්තෙක්ම එසේ තෝරාගනු ලැබූ බව දන්වනු ලැබූ වහාම තමන් තෝරාගනු ලැබ ඇත්තේ කවර ඉඩමක් සඳහා ද, ඒ ඉඩම වෙනුවෙන් අක්කරයකට රුපියල් 25,000 බැගින් ගණන් බලනු ලබන මුදලක් තැන්පත් කළ යුතු වේ. මෙම තැන්පතුව ආපසු නොගෙවනු ලබන නමුත්, තේරුණු තැනැත්තා විසින් ගෙවිය යුතු ගැණුම් මුදලට එය හිලව් කරනු ලැබේ.

8. ඉහත සඳහන් ඉඩම් කච්චේරිය පිළිබඳ විස්තර පහත දැක්වෙන තැනැත්තන්ගෙන් ඔවුන්ගේ නම් ඉදිරියෙන් දක්වා ඇති ස්ථානවලදී ලබාගත හැක.

1. ඩබ්. එම්. සී. කේ. විජේකුරුප්පු, සහකාර ප්‍රාදේශීය ලේකම්, ප්‍රාදේශීය ලේකම් කර්යාලය, නිකවැරටිය,
2. ඩී. ජේ. පී. විමලරත්න, ජනපද නිලධාරී, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, නිකවැරටිය.
3. ග්‍රාම නිලධාරීන් (293 නික/උතුර, 294 නික/දකුණ, 296 මාගල්ලේගම, 297 මිල්ලගොඩ, 299 හැවැන්පැලැස්ස, 304 ගලපිටියාගම, 305 හාතිගම්මන, 306 බුදුමුත්තාව, 313 කරකොලේ)

ඉඩම් කොමසාරිස් (වයඹ).

2010 සැප්තැම්බර් මස 17 වැනි දින දී ය.

ආදර්ශ ආකෘති පත්‍රය

**පදිංචිවීම/ව්‍යාපාරික කටයුතු සඳහා ඉඩම් ඉල්ලීමේ ඉල්ලුම් පත්‍රය**

1. ඉල්ලුම්කරුගේ සම්පූර්ණ නම :————.
2. ලිපිනය :————.
3. උපන් දිනය :————, වයස :————.
4. රැකියාව :————.
5. භාර්යාවගේ/පුරුෂයාගේ නම :————.
6. රැකියාව :————.
7. පවුලේ සංඛ්‍යාව :————, පවුලේ වාර්ෂික ආදායම :————.
8. ඉඩම් ඉල්ලන්නේ පදිංචියට ද/ව්‍යාපාරික කටයුතු වලට ද :————.
   ඉහත කරුණු දෙකටම ද, :————.
   1. නිවේදනයේ සඳහන් ඉඩම් අතුරෙන් ඔබ ඉඩම් ඉල්ලන්නේ කුමන ග්‍රාම නිලධාරී වසමෙන් ද :————.
   2. එම වසමේ ස්ථිර පදිංචිකරුවෙක් ද :————.
   3. එසේ නම් පදිංචි කාලය :————.
   4. එසේ නොවේ නම් ඔබ පදිංචි ග්‍රා. නි. වසම :————.
   5. පදිංචි කාලය :————.
9. තමා සතු ඉඩම් පිළිබඳ විස්තරය
   1. පදිංචි නිවසේ අයිතිකරු :————.
   2. තමාට අයත් ගොඩ ඉඩම් :————.
   3. තමාට අයත් කුඹුරු ඉඩම් :————.
10. රණවිරු පවුලක සාමාජිකයෙක් නම් පහත විස්තර සපයන්න :————.
   1. මීට පෙර රණවිරු ගම්මානයක ලැබී තිබේ ද :————.
   2. ඒ කිනම් ස්ථානයකින් ද :————.
   3. රණවිරු පවුලකට සම්බන්ධ නම් ඉල්ලුම්කරු තමා ද :————.
   4. වෙනත් අයෙක් නම් ඥාතිත්වය :————.
   5. ඉල්ලුම්කරු නම් :
      (අ) සේවයේ සිටී ද :————.
      (ආ) ආබාධිත ද :————.
      (ඇ) වැන්දඹුද :————.

ඉහත සඳහන් තොරතුරු මගේ දැනීමේ හා විශ්වාසයේ හැටියට නිවැරදි හා සත්‍ය බව සහතික කරමි. වැරදි හා අසත්‍ය තොරතුරු සපයා ඇති බව මා ඉඩම් ලාභියෙකු ලෙස තෝරා ගැනීමෙන් පසුව වුව ද හෙළිවුවහොත් මා නුසුදුස්සෙකු සේ සැලකීමට හේතු වන බව ද දනිමි.

————,
ඉල්ලුම්කරුගේ අත්සන.

දිනය :————.

09-646